2021

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය

தொல்பொருளியல் பட்டப்பின்படிப்பு நிறுவகம்

களனிப் பல்கலைக்கழகம

Postgraduate Institute of Archaeology

University of Kelaniya



පුරාවිද්‍යා පශ්චාත් උපාධි අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

தொல்பாருளியல் பட்டப்பின்படிப்பு நிறுவகம்
களனிப் பல்கலைக்கழகம

Postgraduate Institute of Archaeology
University of Kelaniya

වාර්ෂික වාර්තාව **2021**
வருடாந்த அறிக்கை 2021
ANNUAL REPORT 2021

වාර්ෂික වාර්තාව 2021 3-91

வருடாந்த அறிக்கை 2021 92-194

ANNUAL REPORT 2021 195-286

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව
2021

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
407, බෞද්ධාලෝක මාවත
කොළඹ 7

කෙටි යෙදුම්

PGIAR	Postgraduate Institute of Archaeology
ICOMOS	International Council on Monuments and Sites
ICCROM	International Centre for the Study of the Preservation and Restoration of Cultural Property
SLQF	Sri Lanka Qualification Framework
PG. Dip	Postgraduate Diploma
MA	Master of Arts
MSc.	Master of Science
MPhil	Master of Philosophy
PhD	Doctor of Philosophy
ICT	Information and Communication Technology
LCMA	Laboratory for Cultural Material Analysis
LED	Light-Emitting Diode.
NGO	Non-Governmental Organization
UMO	Upper Ma Oya
BC	Before Christ
AD	Anno Domini
YOMB	Yan Oya Middle Basin Mortuary Archaeology Research Project
UK	United Kingdom
CCF	Central Cultural Fund
SEDRIC	Social Ecological Dynamic in Rapid Economic Development
USA	United States of America
ISSN	International Standard Serial Number
NIE	National Institute of Education
OPA	Organization of Professional Association
SEN	Sendalpaliyan in Chennai
HABCOM	Human and Biosphere Commission
INQUA	International Quaternary Union
FSPI	French Sri Lanka Principal Investigator
SEDRIC	Social Ecological Dynamics in Rapid Economic Development Infrastructure and coastal Change in South eastern Sri Lanka
IFP	French Institute of Pondicherry
CNRS	French National Center for Scientific Research
AHRC	Archaeological Heritage Research Cooperation
PALAEO	Palaeoecology
PALBO	Palaeobotany
JAS	Journal of Archaeological Science
SCI	Science Citation Index
JAS-REP	Journal of Archaeological Science Report
HOL	Holocene

දැක්ම

දකුණු ආසියාවේ පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයයන්හි පර්යේෂණයෙහි හා උසස් අධ්‍යාපනයෙහි විශිෂ්ටතා කේන්ද්‍රස්ථානය බවට පත් වීම

මෙහෙවර

(1) අතීතයෙන් උරුම වූ සුවිශේෂ දැනුම් සම්භාරය වර්තමාන ප්‍රයෝජනය සඳහා ගෙනහැර දැක්වීමට සිසු සිසුවියන් පුහුණු කිරීම

(2) ගෝලීය පුරවැසියන් ලෙස සමෘද්ධිමත් වීමට අවශ්‍ය දැනුම, ප්‍රඥාව සහ කුසලතා ඔප් නංවන විශිෂ්ට අධ්‍යාපනයක් කලාපය පුරා ව්‍යාප්තව සිටින සිසු සිසුවියන්ට ලබා දීම;

(3) පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම, බෙදා හැරීම සහ යෙදවීම සඳහා නායකත්වයට කැපවී සිටීම;

(4) ශිෂ්‍යත්ව, පර්යේෂණ, උගත් වෘත්තීන්, රාජ්‍ය අංශය, ව්‍යාපාර සහ නව්‍යකරණයන්හි ශ්‍රී ලංකාවේ උරුමය පිළිබඳ අවබෝධයක් ඇති අනාගත පරපුරේ නායකයින් සංවර්ධනය කිරීම.

ආයතනික අභිමතාර්ථ

අභිමතාර්ථය 1:

පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ තරඟකාරී විශේෂඥයින් පුහුණු කිරීම

අභිමතාර්ථය 2:

පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයන් පිළිබඳ ප්‍රධානතම ආයතනයක් ලෙස පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි විභවතාවයන් වැඩිදියුණුකිරීම.

අභිමතාර්ථය 3:

රටේ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායී ලෙස සහභාගීවීම.

අධ්‍යක්ෂකගේ සමාලෝචනය



පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කරන ලද අවස්ථාවේ සිට වසර තිහක අධික කාලයක් තිස්සේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙහි අත්දැකීම් ලබමින් එහි කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් සිටි මා 2019 වසරේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරි තෙවසරක කාලය සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. එම විශේෂ සම්මුඛ පරීක්ෂණයේදී මම අධ්‍යක්ෂවරයා ලෙස මගේ පත්වීමත් සමග පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය බොහෝ මානයන්ගෙන් ඉදිරියට ගෙන යා යුතු බව සහ ගෙන යායුතු බව අනාවරණය කළෙමි. අපේ අරමුණ වනුයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි බහුවිධ මුහුණුවරින් ගෝලීය ප්‍රවේශයක් වෙත ඔසවා තැබීමේ අරමුණ පෙරදැරිව පුරා දශක තුනකට වැඩි කාලයක් තිස්සේ සංවර්ධනය කරන ලද පුරාවිද්‍යා ක්ෂේත්‍රය කාර්ය මණ්ඩලයේ අදහස් සහ කළමණාකරණ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීමයි.

අපේ අභිප්‍රාය වනුයේ ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට මනාව සරිලන්නාවූ සිසුන් සහ පර්යේෂකයන් නිර්මාණය කිරීම හරහා ගොඩබිම සහ ජලාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික ගුණාංගයන් ගෙන් සමන්විත පුරාවිද්‍යා සංවේදනයන්ගෙන් පිරිපුන් පුද්ගලයකු නිර්මාණය කිරීම සහ ඔහු ක්ෂේත්‍රයෙහි සක්‍රීය අයකු බවට පත් කිරීම මගින් පුරාවිද්‍යා ශික්ෂණය සහ අද දවසේ දැක්ම සහ ප්‍රතිපත්ති ප්‍රකාශය සමග මනාව සංයෝජනය කරමින් සියයකට ආසන්න අදාල මූලික සංකල්ප භාවිතා කිරීම මගින් තිරසර සංවර්ධනයක් පිණිස පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඔසවා තැබීමයි.

ශ්‍රී ලංකාවේ උරුම කළමණාකරනය සහ පුරාවිද්‍යා ප්‍රයත්නයන් ක්‍රියාත්මක කරන්නාවූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල වැනි ආයතනයන්හී අවශ්‍යතාවන් හඳුනාගනිමින් ජාතික අවශ්‍යතාවන්ට මනාව ගැලපෙන ප්‍රායෝගික මට්ටමේ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත උගතුන් නිර්මාණය කිරීම සහ ඔවුන් සමග නිරන්තරවම වැඩමුළු පැවැත්වීම, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමග සෘජු සම්බන්ධතා සහිත ස්මාරක සහ වැඩබිම් සඳහා වන ජාත්‍යන්තර සභාව ICOMOS, සංස්කෘතික දේපල සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය පිලිබඳ අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය ICCROM වැනි ජාත්‍යන්තර ආයතන සමග එක්ව කටයුතු කිරීම සහ පුරාවිද්‍යා ඥයන්ගේ සභාව සහ ජාතික භාරය සමග සබඳතා පවත්වා ගනිමින් පුළුල් සබඳතා ක්ෂේත්‍රයක එක්සත් ආයතනයක් ලෙස ප්‍රගතිය කරා ගමන් කිරීම ආයතනයේ මූලික අරමුණ සහ අභිමතය වේ.

වර්තමාන ගෝලීය අවශ්‍යතාවන්ට මනාව ගැලපෙන නව විද්‍යාත්මක මුහුණුවරක් සහිතව පවත්නා පුරාවිද්‍යා සහ ඒ ආශ්‍රිත අධ්‍යයන වැඩ සටහන් වර්ධවය කිරීම, ශ්‍රී ලංකාවෙහි උරුමය හා සම්බන්ධිත අංශයෙහි අවශ්‍යතාවන් සපුරාලීම, වඩා විද්‍යාත්මක ආකාරයකින් නව අධ්‍යයන වැඩ සටහන් හඳුන්වාදීම නව තාක්ෂණය, නව උපාය මාර්ග, නවෝත්පාදන දැනුම හඳුන්වාදීම මගින් පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය වර්ධනය කිරීම, කථිකාචාර්යවරුන්ගේ අධ්‍යයන දැනුම සහ සිසුන්ගේ අධ්‍යාපන මට්ටම වර්ධනය කිරීම මගින් ගෝලීය මට්ටමට ළඟාවීම, සහ දෙවන පෙල ශිෂ්‍ය කණ්ඩායම් සහ උපාධි අපේක්ෂක සිසුන් නිර්මාණය කිරීම හරහා ආයතන ව්‍යුහය වර්ධනය කිරීම සහ පුරාවිද්‍යා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය අපේ පුළුල් අපේක්ෂාව වේ.

මේ හා සමගාමීව ජාත්‍යන්තර මට්ටමින් සිසුන් ආකර්ශණය කිරීම උදෙසා ජාත්‍යන්තර ප්‍රමිති ක්ෂේත්‍ර කාර්යයන් පුළුල් කිරීම සහ දැනටමත් අප සතුව පවත්නා, විදෙස් සරසවි සමග වන ස්ථාපිත අවබෝධයන් සහ සබඳතා ශක්තිමත් කරමින් මේ ආයතනය ශ්‍රී ලංකාවෙහි පුරාවිද්‍යා සහ උරුම කළමණාකරනය පිලිබඳ අධ්‍යයන කේන්ද්‍රය බවට පත්කිරීමද මගේ කාර්ය භාරය අතර වේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ එම් ගාමිණී අධිකාරී. (**Phd, FSLCA)**

පටුන

පිටු අංක

1 කොටස: හැඳින්වීම 08

2 කොටස: කළමනාකරණ මණ්ඩලය 09

3 කොටස: සංවිධාන සටහන 10

4 කොටස: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තරය 11

04.1 පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනයේ වටිනාකම්

04.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාර්ගෝපදේශ මූලධර්ම

04.3 ආයතනයේ කාර්යසාධනය ඉහළනැංවීම සඳහා අනුගමනය කිරීමට යෝජනා කරඇති කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ගවල මැනියහැකි සාරාංශය

04.4 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණ ඒකකය

04.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණ ඒකකය

04.6 තිරසර සංවර්ධනය සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දායකත්වය.

04.7 අනෙක් ආයතන වෙත පහසුකම් සැපයීම

5 කොටස: සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර 15

6 කොටස: දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර 17

7 කොටස:කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 18

8 කොටස: වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර 20

9 කොටස: ලබාගත් සම්මාන පිළිබඳ විස්තර 20

10 කොටස: රැස්වීම් පිළිබඳ විස්තර 20

11 කොටස: පර්යේෂණ ව්‍යාපෘති

අ). පුවිපඋආ පර්යේෂණ අංශය මගින් පවත්වන ලද පර්යේෂණ ක්‍රියාකාරකම්හී ප්‍රගතිය 21

ආ) පුවිපඋආ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලද විවිධ වැඩමුළු සහ ක්ෂේත්‍ර චාරිකා 29

ඇ) ජාතික සහ ජාත්‍යන්තර සම්මාන 34

ඈ) විදේශ විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් අධ්‍යයන සහයෝගීතාවසහ පර්යේෂණ සහ පර්යේෂණ සඳහා පහසුකම් සැපයීම ප්‍රවර්ධනය කිරීම 35

ඉ) මහජනයා උදෙසා වන ප්‍රකාශනයන් 35

ඊ) ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සහයෝගීත්වය (NIE)/මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය පුහුණුකිරීම 36

උ)මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් 37

ඌ) අනෙක් දෙපාර්තමේන්තු සහ ආයතන සමග අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාවන් ප්‍රවර්ධනය/ පහසුකම් සැපයීම 37

එ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රකාශන 39

12 කොටස: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විමර්ශන පුස්තකාලය 42

13 කොටස: මූල්‍ය ගිණුම් 2021 48

14 කොටස: කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව 86

හැඳින්වීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය(PGIAR) පුරාවිද්‍යාත්මක පර්යේෂණ සඳහාවන කේන්ද්‍රස්ථානය වේ. පුරාවිද්‍යාත්මක පර්යේෂණ යනු සමාජවිද්‍යාවේ ප්‍රධාන අංශ, මානවශාස්ත්‍ර හා අභිලේඛන, සංඛ්‍යාශාස්ත්‍ර, චිත්‍ර, කලා-ඉතිහාසය, ඓතිහාසික පුරාවිද්‍යාව, සමාජ පුරාවිද්‍යාව, සංරක්ෂණය, ප්‍රාග් ඉතිහාසය, උරුම අධ්‍යයනය, කෞතුකාගාර අධ්‍යයනය වැනි පිරිසිදු විද්‍යාවන් මත පදනම්ව අපගේ විශේෂයේ ඉතිහාසය (මානව වර්ගයාගේ අතීතය)හෙළි කිරීමට සහ ඉතිහාසය නම්වූ ග්‍රන්ථයේ අස්ථානගත වූ පිටු සොයා දීම සඳහාවූ මාර්ගයකි. 1986 වර්ෂයේ දී ආරම්භකරන ලද මෙය, පුරාවිද්‍යාවන් පිළිබඳ ගෝලීය පරිමාණයෙන් සක්‍රියව පර්යේෂණ සිදුකරන ශ්‍රී ලංකාවේ පිහිටිආයතන කිහිපය අතරින් එකකි. ජෛවවිද්‍යාත්මක ඒකාබද්ධප්‍රවේශයන් සමඟ පෞරාණික පරිසරවිද්‍යාව, විවිධ අංශ සහ පරාග පිළිබඳ පුරාවිද්‍යා අධ්‍යයනයන්, පෞරාණික දේශගුණය, පෞරාණික පාරිසරික වෙනස්කම්, ලෝහවිද්‍යාව, වැළලූණු දේපිළිබඳ පුරාවිද්‍යා අධ්‍යයනයන්, අස්ථි පිළිබඳ පුරාවිද්‍යාව සහ පින්තාරු සංරක්ෂණය වැනි පුරාවිද්‍යාවිද්‍යාවේ නව ප්‍රවණතා සඳහා කටයුතු කරන එකම ආයතනය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය වේ. "Journal of Archaeological Science", "Quaternary International, Quaternary Science Reviews", "Journal of Quaternary Science and Journal of Palaecology", Palaeogeography and Palaeoclimatology"වැනි ඉහළ බලපෑමක් සහිත දර්ශක සඟරා ප්‍රකාශනවල පිළිබිඹුවන පරිදි පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය පර්යේෂණ හා අත්දැකීම්වල විශිෂ්ටත්වය සඳහා ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්ව ඇතිබව මෙයින් ඇඟවෙයි.

මෙම පසුබිම සමඟ ආයතනය උපාධිධාරී චින්තනයට සහ පර්යේෂණ සිසුන්ට විශිෂ්ට අධ්‍යයන පරිසරයක් සපයයි. ආයතනයේ පවත්වාගෙනයනු ලබන පාඨමාලා අතරඩිප්ලෝමා, ශාස්ත්‍රපති, සහ විද්‍යාපති පාඨමාලා ඇතුළත්ය. පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, සහ විද්‍යාපති පාඨමාලා ඉගැන්වීම්, ක්ෂේත්‍ර හා රසායනාගාර වැඩසටහන් තුළ පූර්ණ ලෙස ඒකාබද්ධ වී ඇත. මෙම ආයතනය පුරාවිද්‍යාවේ පර්යේෂණ උපාධි (ශාස්ත්‍රපති, විද්‍යාපති, දර්ශනපති සහ දර්ශන විශාරද)සඳහා ඉහළින්ම පිළිගත් මධ්‍යස්ථාන අතරින් එකකි. අවසාන වශයෙන්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි වැදගත් මෙහෙවර වනුයේ අප රටේ අතීත ශිෂ්ඨාචාරය පිළිබඳ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සහ අපගේ ජාතිය ගැන අභිමානයක් ඇතිකරලීම සඳහා සහ අපගේ උරුමය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත්වීම උදෙසානව දැනුම මහජනයා වෙත ලබා දීමයි.



02. කළමනාකරණ මණ්ඩලය

නිල බලයෙන් පත්වූ සාමාජිකයන්:

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී	-	අධ්‍යක්ෂ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කේ.ඩී.එස් ආර් පෙරේරා මහතා	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් , ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය,
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග	-	පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
මහාචාර්ය ආරියරත්න ජයමහ	-	පීඨාධිපති, උපාධි අධයයන පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය
ආචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු	-	පීඨාධිපති, වාණිජ සහ කළමණාකරන අධ්‍යයන පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය
එච් ඩී සී ජානකී මිය	-	අධ්‍යක්ෂ, (ශිෂ්‍ය ණය) අධ්‍යාපන අංශය අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත්කරන ලද සාමාජිකයන්:

මහාචාර්ය කේ ඩී පරණවිතාන
සේවාර්ජිත මහාචාර්ය ටී ජී කුලතුංග
වාස්තුවිද්‍යාඥ. ඇෂ්ලි ඩි වෝස්

මහාචාර්ය ගාමිණී රණසිංහ	-	ඉතිහාස සහ පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම්	-	අධ්‍යනාංශ ප්‍රධානී, ගණකාධිකරන දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාරය හේමන්ත සිරිසේන		
ආචාර්ය චමින්ද අබේසිංහ	-	ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශය, කැළණිය විශ්ව විද්‍යාලය

ජ්‍යෙ. සහකාර ලේඛකාධිකාරී (ලේකම්)
කජෙන්තිනී තර්මන්ත්

සහකාර මූල්‍යාධිකාරී (ආරාධනය මත)
රන්ජලා කාරියවසම් මිය

03. සංවිධාන සටහන


කළමනාකරණ මණ්ඩලය
අධ්‍යයන මණ්ඩල
අධ්‍යක්ෂක
ශාස්ත්‍රීය
අධ්‍යයන සහ පර්යේෂණ ආධාරක පහසුකම්
පුස්තකාලය
පරිපාලන
මූල්‍ය
විශේෂ ඒකකය
කලාව සහ උරුමය
සමාජ පුරාවිද්‍යාව
පරිසර පුරාවිද්‍යාව
ජෛව සහ භූ පුරාවිද්‍යාව
පුරාණ ලෝහ විද්‍යාව
ඓතිහාසික භූගෝල විද්‍යාව
සිතියම්කරණය සහ කෙටුම්පත් කිරීමේ පහසුකම
ප්‍රකාශන සහ තොරතුරු පහසුකම
දෘශ්‍ය සහ ඩිජිටල් මාධ්‍ය පහසුකම
ක්ෂේත්‍රර වැඩ පහසුකම
සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණ රසායනාගාරය
ශිෂ්‍ය පරිගණක පහසුකම
අස්ථි විද්‍යාව සහ පුරාණ DNA පර්යේෂණ
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
කාර්ය මණ්ඩලය
නියෝජ්‍ය ලේඛකාධිකාරි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
සහකාර ලේඛකාධිකාරි
කාර්ය මණ්ඩලය
නියෝජ්‍ය මූල්‍යාධිකාරි
සහකාර මූල්‍යාධිකාරි
කාර්ය මණ්ඩලය

04. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තරය

04.1 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වටිනාකම්

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ශාස්ත්‍රීය කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් මෙහෙයවනු ලබන පුරාවිද්‍යාවේ සහ ආශ්‍රිත විෂයයන්හි ශිෂ්‍යත්ව, නවෝත්පාදන හා සමාජ වගකීම් විශිෂ්ටත්වය පෝෂණය කරයි. එහි අගයන් පහත දැක්වේ.

විශිෂ්ටත්වය සඳහා කැපවීම සහ කුසලතා මත දියුණුව

සාධාරණත්වය, අවස්ථාව සහ සමානාත්මතාවය

විවිධත්වය

අධ්‍යයන අඛණ්ඩතාව සහ වෘත්තීයභාවය

සර්වග්‍රාහීබව

විවෘතභාවය

හැසිරීමේ සදාචාරාත්මකවපිළිගත හැකි ප්‍රමිතීන්

නවෝත්පාදන හා නිර්මාණශීලිත්වය පෝෂණය කිරීම

පරිපාලනයේ වගවීම සහ විනිවිදභාවය

නායකත්වය සංවර්ධනය කිරීම

පාරිසරික තිරසාරබව

04.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාර්ගෝපදේශ මූලධර්ම

පුරාවිද්‍යාව සහ එහි විවිධ උප විෂයයන් පිළිබඳ අවබෝධය, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා මනාව අර්ථ දැක්වූ ක්‍රියාපටිපාටි සමඟ සම්බන්ධව උසස් තත්ත්වයේ අධ්‍යයන, කාර්යක්ෂම හා මිත්‍රශීලී පරිපාලන පරිසරයන් සමඟ සම්බන්ධවීමට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී ඔබට විශිෂ්ටඅවස්ථාවක් ලැබේ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ධාරිතාව තුළ උසස් තත්ත්වයේ ශිෂ්‍යත්ව, දැනුම බෙදාහැරීම සහ හොඳම සහ පළපුරුදු සමානයන් අතර වඩා හොඳ අධ්‍යාපනික අන්තර් සම්බන්ධතාවයක් ඇතිකිරීම සඳහා ඉතා සාධාරණ හා සමාන අවස්ථා ලබාදෙන පර්යේෂණ, ඉගැන්වීම් සහ අධීක්ෂණය සඳහා පුළුල් පරාසයක විද්වතුන් ඇතුළත් වේ.

04.3 ආයතනයේ කාර්යසාධනය ඉහළනැංවීම සඳහා අනුගමනය කිරීමට යෝජනා කරඇති කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ගවල මැනියහැකි සාරාංශය:

4.3.1 පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය මේවනවිට පශ්චාත් උපාධි ආයතනයක් ලෙෂ එහි නිශ්චිත අවශ්‍යතා සපුරාලීමට හැකි පුළුල් අධ්‍යයන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනයකර ඇතිඅතර ශිෂ්‍යඅත්පොතක් ද සකස් කොට ඇත.

4.3.2 පුරාණ-දේශගුණය, පුරාණ -පාරිසරික වෙනස්කම් සහ සංඛ්‍යාත්මක හා අභිලේඛන අධ්‍යයනය සඳහා ප්‍රවේශය ලබා දීම සඳහා නවපාඨමාලා ඒකක දෙකක් හඳුන්වාදෙන ලදී.

4.3.3 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්ෂේත්‍ර චාරිකා සහ විද්‍යාගාරවල කටයුතු කිරීමට පශ්චාත් උපාධි සිසුන්ටඇති පහසුකම් සවිමත්කරන ලදී.

4.3.4 ජාත්‍යන්තර හා ජාතික ප්‍රජාවන් සමඟ එක්ව අධ්‍යයන ආධාරක වැඩසටහන් 7 ක් (සම්මන්ත්‍රණ සහවැඩමුළු)අවසන්කර ඇත. මේ සම්බන්ධයෙන්, අධ්‍යයන සාකච්ඡා, පර්යේෂණ සංසද සහ ප්‍රකාශන සඳහා වැඩිඅවස්ථාවන් ප්‍රමාණයක් ඇතිකර ඇත.

4.3.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පර්යේෂණ ප්‍රකාශන ගණනාවක් බිහිකිරීමට සමත්ව ඇතිඅතර ආයතනයේ සෑම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක්ම මේවනවිට ක්ෂේත්‍ර පර්යේෂණවල නිරතවසිටී. එක් එක් පීඨ සාමාජිකයා සඳහා ගූගල් විශාරද දර්ශකය(Google scholar Index) සහ‘‘Research Gate Accounts’ සංවිධානය කර ඇත.

4.3.6 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට සමස්ත අධ්‍යයන වර්ෂයම කල්වේලා ඇතිව සැලසුම් කිරීමටත්, අනිවාර්ය වැදගත් සිදුවීම් බොහොමයක් කල්තියා සැලසුම්කර ඇති ස්ථිර අධ්‍යයන දින දර්ශනයක් ඉදිරිපත් කිරීමටත් හැකි වී තිබේ.

4.3.7 සාපේක්ෂ වශයෙන් එතරම් ප්‍රමාදයකින් තොරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට ආයතනයට හැකි වී ඇත.

4.3.8 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි විෂය නිර්දේශ සංශෝධනය කිරීමටත් නව උසස් උපාධි පාඨමාලා හඳුන්වා දීමටත් හැකිවිය.

4.3.9 සිසුන් අතර අධ්‍යයන තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට තමන්ගේම නව සම්ප්‍රදායන් ආරම්භ කළහැකිවූ අතර ආයතනයේ කාර්ය මණ්ඩලය සහ පුරාවිද්‍යාඥයන්ගේ ප්‍රජාව අතර ප්‍රජා හැඟීමක් ඇතිකිරීම සඳහා සම්මාන ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට හැකිවිය.

4.3.10 පුරාවිද්‍යාව හා ආශ්‍රිත විෂයයන් සංවර්ධනය කිරීම සඳහා අද්විතීය ලෙෂ දායකවන පුද්ගලයින් සහ ආයතනයට කීර්තියක් ගෙනදෙන පුද්ගලයින් ඇගයීම සඳහා ආයතනය විසින් සම්මාන ප්‍රදානෝත්සවයක් ආරම්භකරන ලදී. සම්මාන ප්‍රදානය කිරීමේ යෝජනාක්‍රමය‘PGIAR Brick Award’ලෙස හැඳින්වේ..

4.3.11 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයෙන් ලබා ගත් පොත් නිශ්චිත කාල සීමාවක් තුළ පුස්තකාලයට නැවත භාර දීම තහවුරු කිරීම සඳහා පුස්තකාල සාමාජිකත්ව පද්ධතියක් සකස් කිරීමට හැකිවූ අතර , පුස්තකාල ආරක්ෂාව වැඩිදියුණු කිරීමටත සහ පුස්තකාල අත්පොතක් සැකසීමටත් හැකිවිය .

4.3.12 ශ්‍රී ලංකාවේ හොඳම පුස්තකාලයකට ප්‍රවේශවීම සඳහා පුරාවිද්‍යාපශ්චාත් උපාධි ආයතන පුස්තකාලය විවෘත කරන ලද අතරපුස්තකාලයේ ඩිජිටල් දත්ත ගබඩාවපිළිබඳ නව වැඩසටහනක් සාකච්ඡා කෙරෙමින් පවතී.

4.3.13 උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, ජාල පද්ධතිය සහ අන්තර්ජාල ප්‍රවේශය ඇතුළත්ව මනා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පහසුකම් ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතී.

4.3.14 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරකම්වලට වැඩි වශයෙන් සම්බන්ධවූ අතර රජයේ ආයතනවල උරුමයට සහ පුරාවිද්‍යාවට අදාළ විවිධ ගැටළු විසඳීමේ ව්‍යාපෘතිවලට සහභාගීවිය.

4.3.15 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය ප්‍රසිද්ධ දේශන වැඩසටහන සහ පදනම් පාඨමාලා වැඩසටහන සමඟ 'රාජ්‍ය ආයතනයක්' වීමේ තම දැක්ම යම් තාක්දුරකට සාක්ෂාත්කර ගැනීමට සමත් වී තිබේ.

04.4 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණය

සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය සහ රටේ පුරාවිද්‍යාව ආශ්‍රිත අනෙකුත් ආයතනවල අවශ්‍යතා සපුරාලීම සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතුව පහත පහසුකම් ඇත.

පෞරාණික පුරාවිද්‍යාව
වාස්තු විද්‍යාව
ප්‍රාග් ඉතිහාසය
උරුම කළමණාකරනය
ස්මාරක සංරක්ෂණය සහ උරුම කළමණාකරනය
කලා ඉතිහාසය
පෞරාණික ලෝහ විද්‍යාව
පාරිසරික පුරාවිද්‍යාව
කෞතුකාගාර අධ්‍යනය
සමුද්‍රික පුරාවිද්‍යාව

04.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණ ඒකකය

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පහත විශේෂීකරණයන් යටතේ පර්යේෂණ සහ ඉගැන්වීම් සිදු කරන අතර පුරාවිද්‍යාත්මක අධ්‍යයනයන් දිගටම කරගෙනයාමට හෝ සිදුකිරීමට කැමති සිසුසිසුවියන්ට තම ඉගෙනුම් මාර්ගය එම විශේෂීකරණයන් අතරින් තෝරා ගත හැකිය.

ක්ෂේත්‍ර පුරාවිද්‍යා ඒකකය
සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහාවන විද්‍යාගාරය(LCMA)
පාෂාණීය ධාතු පරිසර විද්‍යාව(Palaeoecology) සහ ක්ෂුද්‍ර පුරාවිද්‍යා(Palynology) සඳහා විද්‍යාගාරය

04.6 තිරසර සංවර්ධනය සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දායකත්වය.

අරමුණ 07- දූරිය හැකි, විශ්වසනීය, තිරසර, සහ නූතන බලශක්ති ප්‍රවේශයක් සහතික කිරීම

එල්ඊඩී පහන් හඳුන්වාදීම මගින් බලශක්ති භාවිතය අවම කිරීම

ආයතනයේ අවශ්‍යතාවන් සපුරාලීම පිණිස සූර්ය ශක්තිය ලබාගැනීමට ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

- සූර්ය බල ශක්තිය උපයෝගී කරගනිමින් විදුලි බලය භාවිතයට ගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමග සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ විශ්ව විද්‍යාල

ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ඒ සඳහා පහසුකම් සලසාගැනීමට යෝජනාවලියක් ඉදිරිපත් කර තිබේ. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මේ ආයතනයට වයිෆයි සබඳතා ලබාගැනීමට මේ වන විට අවශ්‍ය පියවර ගනු ලබමින් පවතින හෙයින් ඉහත කාර්යයන් සම්පූර්ණ කරගත් පසුව සූර්ය බල ශක්ති ව්‍යාපෘතිය පිණිස ප්‍රතිපාදන සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අරමුණ 12- තිරසර පාරිභෝජන සහ නිපැයුම් මාදිලි සහතික කිරීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කොම්පෝස්ට් පාත්තිය සමගින් කසල කලමණාකරනය සිදුකිරීම සහ එහි නිපැයුම් තිරසර පරිභෝජනය පිණිස යළි භාවිතා කිරීම.

- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කර ඇත්තේ සීමිත ඉඩකඩ ඇති ස්ථානයකය. කෙසේ වෙතත් වර්තමානයේදී පරිශ්‍රයෙහි ඇති කසල සහ අනෙක් කැඩී භාවිතා කරමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර ඒවා පරිශ්‍රයෙහි ඇති පැල වලට යොදනු ලැබේ.

04.7 අනෙකුත් ආයතන සඳහා පහසුකම් සැලසීම

අ) ස්මාරක සහ වැඩබිම් සඳහා වන අන්තර්ජාතික සභාව- ශ්‍රී ලංකාව (ICOMOS)

මෙහිදී සියළුම ක්‍රියාකාරකම් සිදු කෙරෙනුයේ ස්මාරක සහ වැඩබිම් සඳහා වන ජාත්‍යන්තර සභාව- ශ්‍රී ලංකාව (ICOMOS) සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම පරිදිය. ඒ අනුව ජාතික භාරය කාර්යාල කාමරය ලෙස වර්ග අඩි 120ක අවකාශයක් භාවිතා කරන අතර රැස්වීම්, දේශන, වැඩමුළු සංවිධානය කිරීම පිණිස සහය දක්වයි. මේ කාර්යයන් උදෙසා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශ5වණාගාරය සහ අනෙක් සම්පත් භාවිතා කරනු ලැබේ. ස්මාරක සහ වැඩබිම් සඳහා වන ජාත්‍යන්තර සභාව- ශ්‍රී ලංකාව (ICOMOS) පුරාවිද්‍යාව පිලිබඳ කුසලතා, අත්දැකීම් සහ දැනුම බෙදාහරින සහ බෙදාගන්නා ක්‍රියාකාරකම් සංවිධානය කරන අතර ශ්‍රී ලාංකික උරුමයන් ප්‍රවර්ධනය පිණිස දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා සහය දක්වයි. මෙහිදී කළමණාකරන මණ්ඩලය විසින් නිතිපතා එහි කාර්ය සාධනය අධීක්ෂණය කරනු ලබයි.

ආ) ජාතික භාරය- ශ්‍රී ලංකාව

මෙහිදී සියළුම ක්‍රියාකාරකම් සිදු කෙරෙනුයේ ජාතික භාරය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම පරිදිය. ඒ අනුව ජාතික භාරය කාර්යාල කාමරයක් ලෙස වර්ග අඩි 120ක අවකාශයක් භාවිතා කරනා අතර සිය සියළු රැස්වීම් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශ්‍රවණාගාරයෙහි පවත්වයි. ජාතික භාරය මගින් මාසිකව පවත්වනු ලබනා දේශන සැසි සඳහා සහභාගි වනු පිණිස පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සිසුන් හට ඇරයුම් කෙරෙන අතර ජාතික භාරයේ සියළු ප්‍රකාශනයන් පරිත්‍යාග වර්ගීකරණය යටතේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලයට දෙනු ලැබේ. මෙහිදී කළමණාකරන මණ්ඩලය විසින් නිතිපතා එහි කාර්ය සාධනය අධීක්ෂණය කරනු ලබයි.

.

05. සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2019	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2020	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2021	සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය*	සමස්ත පරිපාලන කාර්ය මණ්ඩලය**	සමස්ත අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	48	46	32	12	5	4	21
උරුමයන් පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	7	8	-				
කලා ඉතිහාසය් පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	12	10	-				
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්)	19	18	-				
පුරාවිද්‍යාවපිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (දේශන/පර්යේෂණ)	5	5	12				
පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය (දේශන/පර්යේෂණ)	107	99	25				
පුරාවිද්‍යාවපිළිබඳ දර්ශන විශාරද උපාධිය	21	17	2				
පුරාවිද්‍යා දර්ශනශූරී සහ කලා ඉතිහාසය පිලිබඳ දර්ශනශූරී	43	41	4				
එකතුව	**262**	**244**	**75**	**12**	**5**	**4**	**21**

සටහන-

*ස්ථීර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

** නියෝජ්‍ය මූල්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී / මූල්‍යාධිකාරී,

***මෙම සේවක සංඛ්‍යාව 2018.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුමත කර ඇත.
පසුගිය වසර තුන තුළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සිසුන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඇත. (ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 3ක් වන හෙයිනි.)
පුරාවිද්‍යා විද්‍යාපති පාඨමාලාව පසුගිය වසර 4 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 4ක් වන හෙයිනි.)
කලා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් (දේශන සහ පර්යේෂණ)පසුගිය වසර 4 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 4ක් වන හෙයිනි.)

පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්) සම්බන්ධයෙන් පසුගිය වසර 4 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 4ක් වන හෙයිනි.)
පුරාවිද්‍යාව පිළිබඳ දර්ශන විශාරද උපාධිය සම්බන්ධයෙන් පසුගිය වසර 5 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 5ක් වන හෙයිනි.)
පුරාවිද්‍යා දර්ශනශූරී උපාධිය සම්බන්ධයෙන් පසුගිය වසර 10 ක සිසුන් සැලකිල්ලට ගෙන ඇත. (මේ පාඨමාලාවෙහි උපරිම කාලය වසර දහයක් වන හෙයිනි.)



5.1 උපාධි නොවන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම

පාඨමාලා	ශිෂ්‍ය සංඛ්‍යාව 2018	ශිෂ්‍ය සංඛ්‍යාව 2019	ශිෂ්‍ය සංඛ්‍යාව 2020	ශිෂ්‍ය සංඛ්‍යාව 2021 *
පුරා ජෛව විවිධත්ව ඩිප්ලෝමාව	22	60	49	
කලා ඉතිහාසයේ සහතික පාඨමාලාව	25	40	28	
සත්ව පුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව	48	35	35	
පුරාවිද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	17	25	15	
සංස්කෘතික සංචාරක කටයුතු පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	18	30	30	
පුරාවිද්‍යාව සහ සංස්කෘතික සංචාරක කටයුතු පිලිබඳ ඩිප්ලෝමාව	-	-	62	
එකතුව	**130**	**190**	**219**	

* කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් තවමත් 2020 වසරට අදාල ඇතැම් පාඨමාලා පැවැත්වෙමින් පවතින අතර අයදුම් පත් භාරගැනීමේ ක්‍රියාවලිය 2022 අප්‍රියෙල් මස ඇරඹෙනු ඇත



06. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

පාඨමාලා	2021 බඳවා	1 වන වසර	2 වන වසර	3 වන වසර	4 වන වසර
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	32	32	0	0	0
කලා ඉතිහාසය පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	0	0	0	0
උරුමයන් පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	0	0	0	0
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්)	0	0	6	5	2
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ /දේශන මගින්)	0	12	0	4	1
* පුරාවිද්‍යා/ කෞතුකාගාර අධ්‍යයන/උරුම කළමණාකරනය සහ කලා ඉතිහාසය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ/දේශන මගින්)	12	0	0	0	0
පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය (දේශන / පර්යේෂණ)	25	25	33	35	15
පුරාවිද්‍යාව පිළිබඳ දර්ශන විශාරදඋපාධිය	2	2	3	2	2
පුරාවිද්‍යා/කලා ඉතිහාසය/උරුම දර්ශනශූරී උපාධිය	4	4	4	2	2
එකතුව	**75**	**75**	**46**	**48**	**22**



06.1 උපාධිය ලබනා සිසුන් පිළිබඳ විස්තර

පාඨමාලාව	වසර 2018	වසර 2019	වසර 2020	වසර 2021
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	24	73	22	28
කලා ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	0	0	07
උරුම කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	0	0	06
කෞතුකාගාර අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	0	05	0
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්)	01	01	03	03
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ/දේශන මගින්)	01	01	01	03
පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය(දේශන/පර්යේෂණ)	25	44	04	8
පුරාවිද්‍යාව පිළිබඳ දර්ශන විශාරද උපාධිය	01	03	04	03
පුරාවිද්‍යා දර්ශනශූරී උපාධිය	01	01	01	01
එකතුව	**53**	**123**	**40**	**59**

07. කාර්ය මණ්ඩල තොරතුරු

07.01. ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩලය

***** 2019.09.02 දින සිට වසර තුනක කාලයක් සඳහා අධ්‍යක්ෂවරයා පත් කර ඇත.

****** ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී 2019.05.01 දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරට පත් කර ඇත.

******* සහකාර ලේඛකාධිකාරී 2021.03.22 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට පත් කර ඇත.

සේවා ගණය	වැටුප් කේතය	අනුමත	සත්‍ය	පුරප්පාඩු
අධ්‍යක්ෂක	U-AC 5(II)	01	*01	-
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5(II)	10	02	02
සහාය මාහාචාර්ය	U-AC 4		-	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / කථිකාචාර්ය / කථිකාචාර්ය (ආධුනික)	ශ්‍රේණිය I U-AC 3(I)		02	
	ශ්‍රේණිය II U-AC 3(II)		03	
	කථිකාචාර්ය U-AC 3(III)		01	
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති	U-AC 3(II)	01	01	-
නියෝජ්‍ය ලේඛකාධිකාරී	U-EX 2(a)	01	-	01
නියෝජ්‍ය මූල්‍යාධිකාරී	U-EX 2(a)	01	**01	-
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	U-EX 2(II)	01	***	-
එකතුව		**15**	**11**	**03**

07.02 තෘතීය මට්ටමේ කාර්ය මණ්ඩලය

තනතුර	වැටුප් කේතය	අනුමත	සත්‍ය	පුරප්පාඩු
සහකාර ලේඛකාධිකාරී	U-EX 1(II)	01	*02	-
සහකාර මූල්‍යාධිකාරී	U-EX 1(II)	01	01	-
විද්‍යාත්මක සහකාර II ශ්‍රේණිය / 1 ශ්‍රේණිය	U-AS 2(II)	03	03	-
වැඩසටහන්කරු හා පද්ධති විශ්ලේෂක-IIශ්‍රේණිය / I	U-AS 1(I)	01	-	01
එකතුව		**06**	**06**	**01**

* සහකාර ලේඛකාධිකාරී 2021.03.22 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට පත් කර ඇත

07.03 ද්විතික මට්ටමේ කාර්ය මණ්ඩල විස්තර

තනතුර	වැටුප් කේතය	අනුමත	සත්‍ය	පුරප්පාඩු
කාර්මික නිලධාරීන් III / II / I ශ්‍රේණි	U-MN 1(III)	01	01	-
කාර්මික නිලධාරීන් (සිවිල්) III / II / I ශ්‍රේණි	U-MN 4(II)	01	-	01
කළමනාකරණ සහකාර (පොත් තැබීම) III / II / I ශ්‍රේණි	U-MN 1(III)	01	01	
කළමනාකරණ සහකාර III / II / I ශ්‍රේණි	U-MN 4 (I)	09	02	03
	U-MN 4 (II)		01	
	U-MN 1(III)		02	
	U-MN 1 (I)		01	
පුස්තකාල තොරතුරු සහකාරIII / II / I ශ්‍රේණි	U-MN 1(III)	03	01	01
	U-MN 4(I)		01	
එකතුව		**15**	**10**	**05**

07.04 ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල විස්තර

තනතුර	වැටුප් කේතය	අනුමත	සත්‍ය	පුරප්පාඩු
රියදුරු III / II / I /විශේෂ ශ්‍රේණි	U-PL 3(I)	02	01	-
	U-PL3(III)		*01	
රසායනාගාර සහායක III / II / I/ විශේෂ ශ්‍රේණි	U-PL 2(I)	01	01	-
වැඩ සහායක III / II / I /විශේෂ ශ්‍රේණි	U-PL 1(sp.) U-PL 1 (III)	03	01	02
එකතුව		**06**	**04**	**02**

***** 2021.11.15 දින සිට කාර්ය පැවරුම් පදනමින් සය මසක කාලයක් සඳහා රියදුරු පත් කර ඇත.

08. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහවැඩමුළු පිළිබඳ විස්තර **(කාර්ය මණ්ඩල සහභාගීත්වය)**

විෂය	**පැමිණි සංඛ්‍යාව**	**සම්පූර්ණ කළ**
පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-
ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-
සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-
වෙනත් (උදා: සම්මන්ත්‍රණය / වැඩමුළුව/ ක්ෂේත්‍ර චාරිකා)	12	12
එකතුව	**12**	**12**

09. ලැබුණු සම්මාන පිළිබඳ විස්තර

විෂය	සම්මාන සංඛ්‍යාව	කථිකාචාර්යවරුන් සංඛ්‍යාව
දේශීය සම්මාන	-	-
ජාතික මට්ටමේ සම්මාන	1	-
ජාත්‍යන්තර සම්මාන	6	-
වෙනත්	-	-
එකතුව	**15**	**02**

10. රැස්වීම් පිළිබඳ විස්තර

රැස්වීම	**2021 වසර තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව**
කළමණාකරන මණ්ඩල	09
අධ්‍යයන මණ්ඩල	08
විගණන සහ කළමණාකරන කමිටු	03
පුස්තකාල උපදේශන කමිටුව	04
මූල්‍ය කමිටුව	06

11. පර්යේෂණ ව්‍යාපෘති

(අ) පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂකයන් විසින් සිදුකරන ලද පර්යේෂණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

පර්යේෂණ වැඩසටහනේ නම	අරමුදල්	පර්යේෂණයේ කෙටි විස්තරයක්
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරි		
ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික යුගයේ මානව හා සත්ත්ව කොටස් අධ්‍යයනය කිරීම	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සඳහා වන ප්‍රදානයන්	මේ පර්යේෂණයේදී ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා වැඩබිම් වලින් අනාවරණය කරගන්නා මානව අස්ථි පද්ධති සහ සත්ව අවශේෂයන් පිලිබඳ අධ්‍යයනයක් සිදුකෙරේ. සත්ව පුරාවිද්‍යාව යනු පුරාවිද්‍යා වැඩබිම් වලින් සොයාගනු ලබන සත්ව අවශේෂයන් පිලිබඳව අධ්‍යයනය කිරීමයි. සත්ව පුරාවිද්‍යාවේ අරමුණ වනුයේ මානවයා සහ ඔහුගේ පරිසරය අතර විශේෂයෙන්ම මානවයා සහ අනෙක් සත්ව ගහණයන් අතර සම්බන්ධය පිලිබඳ වඩා පුලුල් අවබෝධයක් ඇති කරගැනීමයි. සත්ව පුරාවිද්‍යාව යනු එහි ඇති පුළුල් විෂයාන්තර ලක්ෂණ මගින් විස්තර කෙරෙන්නක් වන අතර මේ ලක්ෂණ මගින් ක්ෂේත්‍රයේ සියළු පාර්ශවයන් පිලිබඳව ආවරණය කෙරෙනා සංක්ෂිප්ත විවරණයක් ලිවීම අපහසු කරයි. විසල් පරාසයක් ඇති න්‍යායාත්මක උනන්දුවක් සහ පුහුණුවක් ඇති විද්වතුන් විසින් ලෝක පරිමාණයෙන් සත්ව අවශේෂයන් පිලිබඳ අධ්‍යයනයන් සඳහා මෙකී විවිධත්වය බොහෝ භෞතික, ජෛව විද්‍යාත්මක, පාරිසරික, සහ මානව වංශ විද්‍යාත්මක සංකල්ප සහ ක්‍රමවේදයන් භාවිතා කිරීම පිණිස යොදාගත හැකිය. . මෙහිදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කැළණිය විශ්ව විද්‍යාලය) යන ආයතනයන්හී තැන්පත් කර ඇති මානව අස්ථි පද්ධති කොටස් කෙරේ විශේෂ අවධානයක් යොමු කෙරේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව		
තොප්පිගල වන රක්ෂිතය තුළ සිදුකරන ක්ෂේත්‍ර ගවේෂණයක් රග්ගල කඳුවැටියේ සිදුකරන ලද ක්ෂේත්‍ර ගවේෂණයක් පුල්මුඩේ ප්‍රදේශයේ සිදුකරන ලද ක්ෂේත්‍ර ගවේෂණයක්	නැගෙනහිර පලාත් සභාව - - -	තොප්පිගල ගවේෂණය පිලිබඳ විස්තරාත්මක වාර්තාව (ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා වෙත පිලිගන්වන ලදී.) රග්ගල ගවේෂණ වාර්තාව(සැකසෙමින් පවතී) පුල්මුඩේ පලාතේ කරන ලද ගවේෂණය පිළිබඳ වාර්තාවක්
ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක		
1. සෙඩ්‍රික් ව්‍යාපෘතිය: වේගී ආර්ථික සංවර්ධනය තුළ සමාජ- පාරිසරික ගතිකයන් :- ගිණිකොනදිග ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සහ වෙරළබඩ වෙනස්වීම් (**SEDRIC-ව්‍යාපෘතිය**). මේ වනාහී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (පුරාණ පාරිසරික සහ පාරිසරික පුරාවිද්‍යාව)පර්යේෂණ සමග සෘජුවම සම්බන්ධ වී ඇති ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතියකි.	1. සෙඩ්‍රික් ව්‍යාපෘතිය වෙනුවෙන් වැඩ කරනා ප්‍රධාන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු වන ආචාර්ය ආර් ටී ප්‍රේමතිලක හට කොළඹ ප්‍රංශ තානාපති කාර්යාලය සහය යටතේ සෘජුවම ප්‍රංශ-ඉන්දු- ශ්‍රී ලංකා සහයෝගීතාව විසින් අරමුල් සපයනු ලබන සහ පොන්ඩිචේරී හී ප්‍රංශ ආයතනය/ඉන්දියාව් පැලිනොලොජී සහ පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාගාරය සෘජු සහයෝගය මත අරමුදල් සපයා ඇත. කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් කල්තබා කිව නොහැකි අභියෝගයන් මේ පර්යේෂණ ව්‍යාපෘතියට එල්ල වූ නමුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාගාරයේ අඛණ්ඩ අසීරු කාර්යයන් සහ ව්‍යාපෘතියේ අනෙක් ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් සමග පවත්වන ලද සාකච්ඡා සංසද මගින් මේවා මනාව කළමණාකරනය කරන ලදී. https://www.ifpindia.org/projects/social-ecological-dynamics-in-rapid-economic-development-infrastructure-and-coastal-change-in-south-eastern-sri-lanka/	දකුණු ආසියාවේ සමාජ පාරිසරික, ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් වර්තමානයේ වැඩ කරනා ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂකයන් අතර සහයෝගීතාව ශක්තිමත් කරනු පිණිස සෙඩ්‍රික් ව්‍යාපෘතිය නිර්මාණය කරන ලදී. තවද මේ ව්‍යාපෘතිය මගින් දකුණු ආසියාවේ පරිසරයට පුරා පාරිසරික විද්‍යාව කාළගුණ වෙනස්කම්, සහ පුරාණ මානව බලපෑම් දේශීය ධාරිතා සංවර්ධනය, පශ්චාත් සිසුන්ගේ පුහුණුව (06 දෙනෙක්) නිපුණතා සංවර්ධනය, දැනුම් හුවමාරුව සඳහා උපකාර කරනු ලබයි. පශ්චාත් උපාධි අධ්‍යයන සිසුන් ඇතුළුව ආචාර්ය ටී ආර් ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම පුරා වෙරළබඩ පාරිසරික වෙනස්කම් සහ සමාජ පාරිසරික වෙනස්තම් මෙන්ම ගිණිකොන දිග වෙරළබඩ කලාපයේ ඒකාබද්ධ කළමණාකරනය අතර සම්බන්ධය (හම්බන්තොට සිට මඩකලපුව දක්වා) පිළිබඳ අවබෝධයක් ලබනු පිණිස වැඩ කරයි. පුළුල් සංවර්ධන වැඩ සටහන් යටතේ ඉන්දු පැසිෆික් කලාපය තුළ විද්‍යාත්මක හවුල්කාරීත්වය ශක්තිමත් කරමින් විශේෂයෙන්ම මේ ව්‍යාපෘතිය 'නිල් ආර්ථිකය' (සාගරික සහ වෙරළ සම්පත් තිරසර කලමණාකරනය) සංවර්ධන ප්‍රතිපත්තිය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මෝසම් වැසි වර්තමාන ලෝක

		ජනගහනයෙන් කාලක ජීවන පද්ධතිය හා කේන්ද්‍රගත වන අතර පුළුල් පාරිසරික සහ සමාජ බලපෑම් ඇති කරයි. උප මහාද්වීපය හරහා වන කෘෂිකාර්මික නිමවුම් සහ එහි ප්‍රතිපල වන ආහාර සුරක්ෂණය විශාල වශයෙන් කාලීන සම්පාදනය සහ ප්‍රමාණවත් වර්ෂාපතන ප්‍රමාණයන් මත රඳා පවතී. මේ ව්‍යාපෘතිය මගින් ඉලක්ක කරනුයේ දකුණු ආසියාව තුළ මෝසම් වර්ෂාපතනයේ බලපෑම අවබෝධ කරගැනීමටය. https://www.ifpindia.org/projects/landscapes-and-waterscapes-in-asia-monsoon-climatic-anomalies-and-societal-dynamics-in-medieval-india
MANDU ව්‍යාපෘතිය: ආසියාවේ භූමි දර්ශණ සහ ජල දර්ශන. මධ්‍යකාලීන දකුණු ආසියාවේ මෝසම් දේශගුණික විෂමතා, සහ සමාජ ගතිකයන්.මේ ශ්‍රී ලංකාවද ඇතුළුව රටවල් 10 ක විශේෂඥයන් සමගින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ව්‍යාපෘතියකි.	2. ආචාර්ය ආර් ටී ප්‍රේමතිලක යනු පොන්ඩිචේරී හී ප්‍රංශ ආයතනය/ පරාග සහ පොසිල විද්‍යා විද්‍යාගාරය/ සමාජ විද්‍යා අධ්‍යනාංශය, /ඉන්දියා හී IFP ආයතනය සහ ප්‍රංශයේ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ ජාතික ආයතනය (CNRS) අතර වන සෘජු සහයෝගයෙන් ක්‍රියාත්මක වන **MANDU** ව්‍යාපෘතියේ ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකි. කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් කල්තබා කිව නොහැකි අභියෝගයන් මේ පර්යේෂණ ව්‍යාපෘතියට එල්ල වූ නමුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාගාරයේ අඛණ්ඩ අසිරු කාර්යයන් සහ MANDU පර්යේෂණ කණ්ඩායමේ රැස්වීම් මගින් මේවා මනාව කළමණාකරනය කරන ලදී.	3. මේ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ වයඹ පලාතේ පුරාවිද්‍යා සහ පාරිසරික උරුමයන් හී අදාලත්වය සහ භාවිතාව පිළිබඳ ඇති අභියෝගයන් ආමන්ත්‍රණය කෙරෙනා සංවාදයක් ඇති කිරීම පිණිස පුරාවිද්‍යා සහ උරුම කළමණාකරනය සම්බන්ධයෙන් සිටිනා ශාස්ත්‍රඥයන් සහ වෘත්තිකයන්, නව පර්යේෂකයන්, සහ පශ්චාත් උපාධි අපේක්ෂකයන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්හී නියෝජිතයන්, ප්‍රජා කණ්ඩායම්, එකට එකතු කිරීම උදෙසා එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව අතර පර්යේෂණ ජාලයක් නිර්මාණය සහ මුලපිරීම මේ ව්‍යාපෘතිය මගින් අපේක්ෂිතය.
පුරාවිද්‍යා සහ පාරිසරික උරුමය	ලසිසෙස්ටර් විශ්ව විද්‍යාලයේ ආචාර්ය රූත් යන්ග් අතර සෘජු සහයෝගයෙන් පවත්වාගෙන	4. ව්‍යාපෘතිය මගින් දකුණු දිග දකුණු ආසියාවේ පූර්ව

	යන්නකි. මේ ව්‍යාපෘතිය 2019 වසර අවසාන භාගයේ ඇඹන ලදද කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් එහි ක්‍රියාකාරකම් සිදු නොවන ලදී. එය 2021 වසරේදී සාකච්ඡා කිහිපයකට සහ ව්‍යාපෘති සැකසුම් ක්‍රියාකාරකම් සීමා විණි. .	එතිහාසික සහ පරිසරය අවබෝධ කරගැනීම ඉලක්ක කරයි.. ඉන්දියාව සහ ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි සිසුන් ගේ සහභාගීත්වයෙන් ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණයන් කරගෙන යනු ලබනා ව්‍යාපෘති ක්‍රියාකාරකම් පසුගිය වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අතරට ශාඛ ශෛල, පරාග, ක්ෂුද්‍ර පොසිල අවබෝධ කරගැනීම සහ ප්ලයිස්ටොසීන පූර්ව එතිහාසික වැඩබිම (ATM වැඩබිම සහ දකුණු ඉන්දියාවේ සන්ද්‍රයාන්පලය (SEN) වැඩබිමෙහි කැණීම් සම්බන්ධයෙන් ඇතිවන පේලියෝ පාරිසරික ක්‍රමවේදී සීමාවන් අතික්‍රමණය කිරීම.http://www.sharmaheritage.com/projects/attirampakkam
2 ATM වැඩබිම සහ දකුණු ඉන්දියාවේ සන්ද්‍රයාන්පලය SEN වැඩබිම **(අට්ම්පක්කම්):** ඉන්දියාව ශ්‍රී ලංකාව ප්‍රංශය සහ පෘතුගාලය යන රටවල විශේෂඥයන් ගේ සහය ඇතිව දකුණු ඉන්දියාවේ සිදුකෙරෙනා ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතියකී	3. පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය/ පරාග සහ පොසිල විද්‍යාව පිළිබඳ විද්‍යාගාරය/ ඉන්දියාව සහ ඉන්දියාවේ ශර්මා මධ්‍යස්ථානය අතර සෘජු සහයෝගයෙන් ක්‍රියාත්මක වන්නකි. කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් කල්තබා කිව නොහැකි අභියෝගයන් මේ පර්යේෂණ ව්‍යාපෘතියට එල්ල වූ නමුදු පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාගාරයේ අඛණ්ඩ අසිරු කාර්යයන් සහ ව්‍යාපෘතියේ අනෙක් ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් පර්යේෂණ කණ්ඩායම සමග පවත්වන ලද	රේඩියෝ කාබන් මගින් දින වකවානු තීරණය කරනු ලබනා බහුවිධ ප්‍රවේශයක් මගින් ප්‍රාග් ඉතිහාසය **ඉතිහාසය**ලසහ ආර්ථික ශාඛ සම්පත් කළමනාකරනය පිලිබඳ අවබෝධයක් ලබාගැනීමට ව්‍යාපෘතියෙන් ඉලක්ක කෙරේ. සිය විද්‍යාපති පර්යේෂණ වැඩසටහන සමගින් විද්‍යාපති උපාධි අපේක්ෂකයන් දෙදෙනකුට මෙහිදී පහසුකම් සලසන ලදී .

	සාකච්ඡා සභාවන් මගින් මේවා මනාව කළමණාකරනය කරන ලදී.	
ෆා හියන් ව්‍යාපෘතිය -: ශ්‍රී ලංකාවේ සහල් සහ කෙසෙල් වගාවේ ප්‍රාග් ඓතිහාසික කතා විමර්ශනය කිරීම.	4. ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාවේ සෘජු අරමුදල් සහ පු වි ප උ ආයතනයේ සුපුරුදු සහයෙන් ක්‍රියාත්ම වෙයි. පසුගිය වසරේ කාර්යය අඛණ්ඩව පවත්වාගෙන යාමකි. කෝවිඩ් 19 හේතුවෙන් මේ ව්‍යාපෘතියට ඇතිවූ කල්තබා කිව නොහැකි අභියෝගයන් විද්‍යාගාර කටයුතු මගින් මනාව කළමණාකරනය කරන ලදී. .	විද්‍යාපති උපාධි අපේක්ෂකයන් දෙදෙනකුගේද සහය සහිතව මේ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළබඩ පාරිසරික වෙනස්කම් සහ ප්‍රාග් ඉතිහාසය අවබෝධ කරගැනීමට අපේක්ෂා කෙරේ.
මීගමු හම්බන්තොට සහ මඩකලපු කලපුවේ පශ්චාත් මධ්‍ය හොලසීන පාරිසරික වෙනස්වීම්	5. ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාවේ සෘජු අරමුදල් සහ **SEDRIC** ව්‍යාපෘතියේ සහයෙන් ක්‍රියාත්මකය. කෝවිඩ් 19 හේතුවෙන් මේ ව්‍යාපෘතියට ඇතිවූ කල්තබා කිව නොහැකි අභියෝගයන් අසීරු විද්‍යාගාර කටයුතු මගින් මනාව කළමණාකරනය කරන ලදී.. .	පරාග පර්යේෂණ හරහා සිංහරාජ වනපෙතෙහි උරුමය පරීක්ෂාවට ලක්කිරීම මේ ව්‍යාපෘතිය මගින් ඉලක්ක කෙරේ. මෙය එක් විද්‍යාපති උපාධි අපේක්ෂකයකු පුහුණු කිරීමේ සහ පර්යේෂණ වැඩ සටහන සහිතව පසුගිය වසරේ සිට කෙරෙනා ව්‍යාපෘතියේම අඛණ්ඩ දිගුවකිග .
1. සිංහරාජ වනාන්තරයේ පාරිසරික උරුමය- අතීතය අවබෝධ කරගැනීම උදෙසා වන පරාග විද්‍යාත්මක ප්‍රවේශය.	6. ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාවේ සෘජු අරමුදල් සහ **SEDRIC** ව්‍යාපෘතියේ සහයෙන් ක්‍රියාත්මකය..	මේ ව්‍යාපෘතිය මගින් යාපන අර්ධද්වීපයේ ප්‍රාග් ඓතිහාසික වැඩබිම් දෙකක පුරා පාරිසරික තත්වයන් විමර්ෂණය කිරීමට ඉලක්ක කෙරේ. මේ ව්‍යාපෘතිය මගින් විද්‍යාපති උපාධි අපේක්ෂකයන් 3 දෙනකු පුහුණු කිරීමට සහ අනාගත අරමුදල් අනුමත කරගැනීමට නව පර්යේෂණ ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමට පහසුකම් සැලසේ . මේ ව්‍යාපෘතිය මගින් යාපනය

		කන්දරෝඩයෙන් රැස්කරගන්නා ලද පෞරාණික රොන්මඩ සැකසුම අවබෝධ කරගැනීමට ඉලක්ක කෙරේ.
ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයේ ඇති අවසාධිත අංශු සම්බන්ධයෙන් බහුවිධ ක්‍රමවේදයන් භාවිතා කිරීමට ඇති හැකියාව අවබෝධ කරගැනීම.	7 ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාවේ සෘජු අරමුදල් සහ **SEDRIC** ව්‍යාපෘතියේ සහයෙන් ක්‍රියාත්මකය.. කෝවිඩ් 19 හේතුවෙන් මේ ව්‍යාපෘතියට ඇතිවූ කල්තබා කිව නොහැකි අභියෝගයන් අසීරු විද්‍යාගාර කටයුතු මගින් මනාව කළමණාකරනය කරන ලදී..	
2. කන්දරෝඩය පුරාවිද්‍යා ව්‍යාපෘතිය	7. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ (ආචාර්ය නිමල් පෙරේරා) සහ ඔහුගේ කණ්ඩායමෙන් ලද සහයෙන් මේ ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලදී. කෝවිඩ් 19 හේතුවෙන් මේ ව්‍යාපෘතියට ඇතිවූ කල්තබා කිව නොහැකි අභියෝගයන් පු වි ප උ ආයතනයේ අසීරු විද්‍යාගාර කටයුතු මගින් මනාව කළමණාකරනය කරන ලදී.. .	
ආචාර්ය අර්ජුන තන්තිලගේ		
‘වීදුරු සහ ඔපදැමීම : පුරාණ ශ්‍රී ලංකාවේ වීදුරුනිෂපාදනය සහ භාවිතා කිරීම සහ ඔපදැමීම (විස්තීර්ණ සහයෝගී පර්යේෂණ ව්‍යාපෘතිය)	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රදානයන් රු. .259,000.00	මේ පර්යේෂණ ව්‍යාපෘතියෙහි මුඛ්‍ය අරමුණ වනුයේ පුරාණ ශ්‍රී ලංකාවෙහි වීදුරු නිෂ්පාදනය සහ ඔප දැමීම පිළිබඳ විස්තීර්ණ අධ්‍යයනයක් සිදු කිරීමයි. එහෙයින් ගිරිබාව නම් වීදුරු නිපැයුම් වැඩබිම පිළිබඳව සහ ගිරිබාවෙහි පුරාණ දේශීය වීදුරු නිෂ්පාදනය සහ ඔපදැමීම සඳහා භාවිතා කරන ලද ද්‍රව්‍ය හඳුනාගැනීම සහ ශ්‍රී ලංකාවෙහි පුරාණ වීදුරු නිෂ්ඝානය කෙරේ අදාල කරගන්නා ලද තාක්ෂණය අවබෝධ කරගැනීම කෙරෙහි මූලික අවධානය යොමු කරනු ලබයි.

ආචාර්ය රෝස් සෝලංගආරච්චි		
ඉහල මා ඔය ජනාවාස රටාව පිලිබඳ අධ්‍යනය **යෝජිත ප්‍රාථමික අදියර නිම කර ඇත.**	**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**	ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ භූගෝලීය සහ කාලානුක්‍රම පිලිවෙලින් ජනාවාස පැතිරීම පිලිබඳව අවබෝධ කරගැනීම මෙන්ම ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පසු නූතන කාලය දක්වා සමාජ ගතිකයන් පිලිබඳ පැහැදිලි චිත්‍රයක් ඇති කරගැනීමය. ප්‍රකාශනය පල කිරීමට කටයුතු කෙරෙමින් පවතී- Solangaarachchi, R. 2021b. (In Press) "**The Settlement Archaeology Research Project in the Upper Ma OyaRegion.**"පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ Occasional Papers/No.1/2021. Colombo: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය කැළණිය විශ්ව විද්‍යාලය. මීට අමතරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය තුළ රැස් කරගත් තොරතුරු මත පදනම්ව තවත් දර්ශනශූරී නිබන්ධ දෙකක් 2022 වසර අවසන ඉදිරිපත් කිරීමට නියමිතය. (ඒ.කුමුදුනි මෙය සහ ප්‍රියන්ත පුෂ්පකුමාර මයා)
ශ්‍රී ලංකාවේ ආරක්ෂණ පුරාවිද්‍යාව ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.	ස්වයං- සම්පාදිත අරමුදල්	මහනුවර හතරලියැද්දේ දුනුකුඹුර ප්‍රදේශයේ නූතන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මගින් පුරාවිද්‍යා උරුමය විනාශව යාමට පෙර හදිසි මෙහෙයුමක් ලෙස ආරක්ෂණ පුරාවිද්‍යා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. දැනටමත් ප්‍රකාශනය පල කර ඇත: "**Rescue Archaeology in the Middle Ma OyaBasin: a case study at Dunkumbura Burial Site in Hataraliyadda**."
සංස්කෘතික සම්පත්/ උරුම කළමණාකරනය පිලිබඳ ප්‍රක්ෂේපණය:	ස්වයං- සම්පාදිත අරමුදල්	Colombo: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය කැළණිය විශ්ව විද්‍යාලය..

විලඳගොඩ/විරඳගොඩ පුරාවිද්‍යා වැඩබිම කරුවලගස්වැව ඉල්ලා සිටින ලද අදියර සම්පූර්ණ කර ඇත.		දැනටමත් ඉල්ලා සිටි බලරීන් වෙත ඉදිරිපත් කර ඇත. මෙකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටින ලද්දේ වයඹ පලාතේ කුරුණෑගල පලාත් පාලන දෙපාර්තමේන්තුවය. ස්වකීය සංස්කෘතික උරුමයන් ප්‍රවර්ධනය උදෙසා ඔවුන්ට දිගු කාලීන උරුම කළමණාකරන උපාය මාර්ගයක් දියත් කිරීමට නියමු වැඩ සටහනක් අවශ්‍යව තිබිණි.
ඩී.එම්.ආර්.ඒ. බණ්ඩාර මයා		
යාන් ඔය මධ්‍ය ද්‍රෝණියේ භූමදාන පිළිබඳ පුරාවිද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය (YOMB)	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	අවසන් වාර්තාව ලියමින් තිබේ.
චීන ශ්‍රී ලංකා සහයෝගීතා පුරාවිද්‍යා ව්‍යාපෘතිය 2017-2023	සිචුවාන් සරසවිය චීනය	පසුගිය වසර තුළසිදුකරන ලද කැණීම් හී පශ්චාත් කැණීම් විශ්ලේෂණය. විශේෂයෙන්ම පුරාණ පිඟන් මැටි සැකසුම් විශ්ලේෂණය.
ඉබ්බන්කටුව මෙලිතික සුසානභූමි කැණීම් ව්‍යාපෘතිය	මධ්‍යම සංස්කෘතික අරමුදල	අවසන් වාර්තාව ලියමින් තිබේ.
එන්.පී.ආර්. නාන්කඳුර මයා		
ආචාර්ය උපාධි පර්යේෂණය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ LCMA ඒකකය මගින් පවත්වනු ලබන තාක්ෂණික කලා ඉතිහාස වැඩසටහන	ප්‍රදාන ප්‍රදාන	වීයිවන සියවස ආරම්භයේ ශ්‍රී ලංකාවේ බස්නාහිර පලාතේ බෞද්ධ සිතුවම්. 18වන සියවසේ නුවර ප්‍රාදේශීය සම්ප්‍රදායේ ආකෘතික සහ තාක්ෂණික විවිධත්වයන්

ආ). පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සංවිධානය කරන ලද විවිධ වැඩමුළු සහ ක්ෂේත්‍ර චාරිකා

වැඩමුළු

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී			
වැඩමුළුවේ නම	කාලය	සම්පත් පුද්ගලයන්	සහභාගිවූවන්/ඉලක්ක කණ්ඩායම
අනුරාධපුරයේ පුරාණ ජෛව විවිධත්වය සහ ජෛව විවිධත්වය පිළිබඳ වැඩමුළුව.	2021/03/30-2021/04/03	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්, පුරාණ ජෛව විවිධත්වය සහ ෂත්වපුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව .
පාෂාණීය ධාතු විද්‍යාව පිලිබඳ වැඩමුළුව :	2021/11/13		පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්, පුරාණ ජෛව විවිධත්වය සහ ෂත්වපුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව .
ආචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක			
වැඩමුළුවේ නම	කාලය	සම්පත් පුද්ගලයන්	සහභාගිවූවන්/ඉලක්ක කණ්ඩායම
1. ඉන්දියාව සහ ශ්‍රී ලංකාවෙන් රැස්කරගන්නා ලද පුරාවිද්‍යාත්මක පාංශු ආදර්ශයන්ගෙන් ලබාගන්නා ලද පරාග ෂහ ශාඛ සෛල ආදර්ශ සැකසීමේ ක්‍රියාවලිය.	1. මාර්තු 01-03	1. ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය සහ පරාග විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය (IFP)	1. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි හදාරන සිසුන්
2. MANDU ව්‍යාපෘතිය ඉන්දියාව	2. අප්‍රියෙල් -04	2. පරාග විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය සහ ඉන්දියාවේ MANDU සංසදයේ සාමාජිකයන්	2. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/රටවල් 10 ක පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
3. පර්යේෂණ රැස්වීම්	3.අප්‍රියෙල් -03	3. SEDRIC ව්‍යාපෘතිය	3. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

4. සූක්ෂම පිටපත් කිරීම සහ පරාගවේදය පිළිබඳ විද්‍යාගාර පුහුණුව	4. අප්‍රියෙල් 9	4.SEDRIC ව්‍යාපෘතිය	4. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
5. දුරස්ථ සංවේදනය පිළිබඳ මාර්ගගත පාඨමාලාව	5.මැයි 5	5.ආචාර්ය ජූලියන් ඇන්ඩ්‍රියූ- SEDRIC ව්‍යාපෘති නායක	5.පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය/ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්
6. පරාග- ශාඛ සෛල-1 SEDRIC පර්යේෂණ ව්‍යාපෘතිය	6.ජූනි 12	6.අධ්‍යක්ෂක IFP	6.පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය/ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්
7.පරාග- ශාඛ සෛල-2 SEDRIC පර්යේෂණ ව්‍යාපෘතිය	7. ජූනි 28	7.අධ්‍යක්ෂක IFP	7. පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය/ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්
8. උද්භිද විද්‍යා සහ පැල හඳුනා ගැනීම-තොරතුරු තාක්ෂණ සහයෙන්	8.අගෝස්තු 03	8. අධ්‍යක්ෂක IFP	8. පශ්චාත් උපාධි හදාරන සිසුන්/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය/ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්
9. චතුර් පර්යේෂණ උදෙසාවන ජාත්‍යන්තර සංගමයේ රැස්වීම (මානව සහ ජෛවගෝලීය කොමිසම) (HABCOM)	9.අගෝස්තු 05	9. Staff of the pollen lab, IFP, India and HABCOM Chairmen.	9. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන්
10. වෙරළ කලාප උදෙසා ඒකාබද්ධ කළමණාකරනයක් හඳුන්වාදීම, ජෛව විවිධත්ව සංරක්ෂණ විද්‍යා ක්ෂේත්‍රයේ සහභාගීත්ව ප්‍රවේශයන්, සහ අන්තර් ශික්ෂණ ක්‍රියාකාරකම්	10.ඔක්තෝබර් 08	10. පරාග විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය, IFP, ඉන්දියාව සහ SEDRIC ව්‍යාපෘති සාමාජිකයන්	10. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන් / පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.
11.SEDRIC පර්යේෂණ රැස්වීම්	11.සැප් 01	11. අධ්‍යක්ෂක IFP	11. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන්

12. RISTCON 2021, 8වන රුහුණු ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ	12. පෙබරවාරි 17	12. රුහුණු විශ්වවිද්‍යාලය	12. විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් / පශ්චාත් උපාධි හදාරන සිසුන්

ආචාර්ය රෝස් සෝලංගආරච්චි			
වැඩමුළුවේ නම	කාලය	සම්පත් පුද්ගලයන්	සහභාගිවූවන්/ඉලක්ක කණ්ඩායම
'නිරූපණය/ ආදර්ශ කැණීම්' පිළිබඳ වැඩමුළුව	2021 මාර්තු 21	ස්වයං දායකත්වය	විද්‍යාපති/ශාස්ත්‍රපති අපේක්ෂකයන් (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරාවිද්‍යාව පිළිබඳ වෘත්තිකයන් ඇතුළුව)
මතුකරනොගන්නා ලද පුරාවස්තුවල සාධිකාරීත්වය හඳුනාගැනීමේ පරිපාටිය පිළිබඳ වැඩමුළුව	2021 ජූලි 05- නොවැම්බර් 27(මසකට වරක්)	ස්වයං දායකත්වය	පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයන් (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ මධ්‍යම සංස්කෘතික අරමුදල) සහ පුරාවිද්‍යා උපාධිධාරීන්

ක්ෂේත්‍ර චාරිකා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී		
ක්ෂේත්‍ර චාරිකාවේ අරමුණ/ අරමුණු	**කාලය / දින**	**සහභාගිවූවන්/ඉලක්ක කණ්ඩායම**
රිදී විහාරය, යාපහුව, සහ පැණිදෙනිය වැඩබිම් චාරිකාව	2021/01/08-09	මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය සහ ව්‍යාපෘති පුහුනුවන්නන්.
සිතුවම් සංරක්ෂණය උදෙසා වන වැඩබිම් චාරිකාව ඔළබොඩුව රජමහා විහාරය (ටැම්පිට විහාරය)	2021/01/13	මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති කළමණාකරුවන්, සිසුන් සහ කාර්ය මණ්ඩලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුහුණු වන්නන්
කුරුණෑගල රිදී විහාරය වෙත ක්ෂේත්‍ර චාරිකාව.	2021/01/18	මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය-කුරුණෑගල ව්‍යාපෘතිය
ත්‍රිකුණාමළය වෙත ක්ෂේත්‍ර චාරිකාව	2021/01/19-20	මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය.
මොණරාගල පුරාවිද්‍යා වැඩබිම වෙත ක්ෂේත්‍ර චාරිකාවග	2021/01/23-24	මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය
කළුතර රිච්මන්ඩ් කාසල් වෙත වැඩබිම් චාරිකාව (සංරක්ෂණ ව්‍යාපෘතිය)	2021/02/03	මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංරක්ෂණ ඒකකය.
මඩකලපුව ව ැඩබිම් චාරිකාව	2021/03/03	මධ්‍යම සංස්කෘතික අරමුදලේ

කුරුණෑගල රිදී විහාරය වෙත ක්ෂේත්‍ර චාරිකාව.	2021/03/05	ව්‍යාපෘති කාර්ය මණ්ඩලය.
